රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. SA/AISD/CIGAS/02/01 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2026.01.05 |

**රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංකය: 01/2026**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

**මුදල් රෙගුලාසි 426 ප්‍රකාරව 2026 වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මාසික ගිණුම් සාරාංශය ඉදිරිපත් කිරීම**

සියලුම අමාත්‍යාංශ, පළාත් සභා, දෙපාර්තමේන්තු සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් 2026 වර්ෂය තුළදී තම මාසික ගිණුම් සාරාංශ නියමිත දිනට හෝ ඊට පෙර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. භාණ්ඩාගාර ගිණුම් නිවැරදිව හා කාලෝචිත ලෙස අධීක්ෂණය කිරීම සඳහා මෙම චක්‍රලේඛයට අනුකූල වීම අත්‍යවශ්‍ය වේ.

## 1. මාසික ගිණුම් සාරාංශ ඉදිරිපත් කිරීම

ඒකාබද්ධ මාසික ගිණුම් ප්‍රකාශන සෑම මසකම **10** වැනි දින රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ NEW CIGAS වෙබ් යෙදුම වෙත උඩු ගත කරනු ලැබේ. සියළුම සාරාංශ ඉදිරිපත් කිරීම් පහත ක්‍රියා පටිපාටියට අනුකූලව සිදුකල යුතුය.

- ජනවාරි සිට නොවැම්බර් දක්වා සෑම මසකටම අදාළ මාසික ගිණුම් සාරාංශ ඊළඟ මස **8** වන දින හෝ ඊට පෙර **cigassummary@sad.treasury.gov.lk** විද්‍යුත් තැපැල වෙත එවිය යුතු වන අතර දෙසැම්බර් මාසික ගිණුම් සාරාංශය මෙම දෙපාර්තමේන්තුව විසින් 2026 මුදල් වර්ෂය සඳහා මුදල් රෙගුලාසි 429 පරිදි නිකුත් කරන ගිණුම් පියවීමේ මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස් පරිදි ඉහත සඳහන් විද්‍යුත් තැපැල වෙතම එවිය යුතුය.

- සාවද්‍ය දත්ත භාණ්ඩාගාර ගිණුම් වලට ඇතුලත් වීම වළක්වා ගැනීම සඳහා New CIGAS වැඩසටහනට ඇතුලත් කරන දත්ත දිනපතා පරික්ෂාකර නිවැරදි තොරතුරු පමණක් එවීමට අදාල නිලධාරීන් වග බලා ගත යුතුය.

- මෙලෙස ඉදිරිපත් කරනු ලබන ගිණුම් සාරාංශය පරික්ෂා කිරීමෙන් පසුව ප්‍රධාන මූල්‍ය **නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී/ගණකාධිකාරීගේ රාජකාරී විද්‍යුත් තැපැල හරහා පමණක්** එවන ලෙසට උපදෙස් ලබා දිය යුතුය.



මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව    பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை.    General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600    Ext.: 1149
Director General - Tel.: +94 11 2484728
Fax: +94 11 2484869
Fax: +94 11 2473856
Website: www.sad.gov.lk
e - mail : dgsa@sad.treasury.gov.lk

## 2. ප්‍රතික්ෂේප කළ මාසික ගිණුම් සාරාංශ ගොනු සම්බන්ධව

හානි වීම හෝ අඩුපාඩු සහිත වීම හේතුවෙන් NEW CIGAS පද්ධතිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ මාසික ගිණුම් සාරාංශ ගොනු රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත සාරාංශ ඉදිරිපත් කිරීම සඳහා භාවිතා කරන ලද විද්‍යුත් තැපැල් ලිපිනය හරහාම එම ආයතනය වෙත දැනුම් දෙනු ලැබේ. නිවැරදි කරන ලද මාසික ගිණුම් සාරාංශ ගොනු **අදාල මාසයේ 9 වැනි දිනට පෙර** නිවැරදි කර නැවත ඉදිරිපත් කළ යුතුය. ප්‍රමාද වන මාසික ගිණුම් සාරාංශ සම්බන්ධයෙන් මු.රෙ. 426 අනුව කටයුතු කරනු ලබන බවද අවධාරණය කෙරේ.

## 3. ඒකාබද්ධ වත්කම් ගොනු ඉදිරිපත් කිරීම

ඊට අමතරව, ඒකාබද්ධ වත්කම් ගොනුවක් ද මාසිකව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය. එම වත්කම් ගොනු ඉදිරිපත් කල යුතු දිනයන් පහත පරිදි වේ.

- ඊලඟ මස **15** වන දිනට ගොනුව ඉදිරිපත් කල යුතුය.
- සියලුම වියදම් ඒකක සඳහා ඔවුන්ගේ වත්කම් ලේඛනය ( SA 82 ) ඊලඟ මස **20** වන දින සිට NEW CIGAS වෙබ් යෙදුම මඟින් උත්පාදනය කර ගත හැක .
- පළාත් සභා සඳහා මෙය අවශ්‍ය නොවේ.

## 4. තාක්ෂණික සහාය

තාක්ෂණික ගැටළු සඳහා, NEW CIGAS උපකාරක සේවාව අමතන්න:

- **විමසුම් දුරකථන අංක:** 0112 484 889 / 0112 484 881 / 0112 034519 / 0112 484826

2026 වර්ෂයට අදාළ භාණ්ඩාගාර ගිණුම් නිවැරදිව හා කාලෝචිත ලෙස සැකසීම සහතික කිරීම සඳහා මෙම චක්‍රලේඛයේ උපදෙස් පිළිපැදීම අත්‍යවශ්‍ය වේ.

**ඩබ්ලිව්. ඒ. සමන්ත උපනන්ද**
**අධ්‍යක්ෂ ජනරාල්**
**රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව**

පිටපත : 01. විගණකාධිපති